

# පීතෘත්වය ද මිල කළ නොහැකිය

මේ ලෝකෙන්ම හිටිය හොඳම අම්මා විතරක් නෙවෙයි, මේ ලෝකෙන්ම හිටිය හොඳම, ආදරණීයම තාත්තත් හිටියෙ අපිට. ඒක මම පෞද්ගලිකවම විශ්වාස කරන දෙයක්. අපේ තාත්තා අපි ගැන පුදුමාකාර විශ්වාසයක් තියපු කෙනෙක්. තාත්තා දැන් ජීවතුන් අතර නැති වුණත්, අදටත් අපි ඒ විශ්වාසය ඒ විදියටම රකිනවා.

මේ රටේ ඉන්න, මේ රටේදි අපි දකින හුඟක් තාත්තලා දිහා බලන්න, ඇත්තටම එයාලා හුඟක් දෙනා කොයිතරම් ආදරණීයද? සමහර වෙලාවල් වලට බස් නැවතුමේදි, මගතොටදි දකින ඒ ආදරණීය තාත්තලා දිහා මං ලොකු ගෞරවයකින් බලාන ඉන්නවා. එහෙම වෙලාවල්වලට මට මගෙ තාත්තාව මතක් වෙනවා.

අම්මලාගෙ සෙනෙහස ගැන කතා කරන බොහෝ දෙනෙක් තාත්තලගෙ සෙනෙහස ගැන කතා කරන්නෙ නැහැ. කතා කළත්, ඒ හරිම අඩුවෙන්. ටී. එම්. ජයරත්න ගායකයාණන් ගායනා කරන ගීතයක රචිකාවියට ' පිය සෙනෙහසට කවි ගී ලියැවුණා මදී ' කියලා ලියන්න සිද්ධ වුණෙත් ඒකනෙ. ඇත්තත් ඒකම තමයි. ඒත්, තාත්තලා වෙනුවෙන් අඩුවෙන් කවි ගී ලියැවුණත්, ගුණ ගායනාවල් නොකෙරුණත් තාත්තෙකුගෙ ආදරය, තාත්තෙකුගෙ අගය මිල කරන්න බැහැ. අම්මෙකුගෙ ආදරය තාත්තෙකුට දෙන්න බැහැ වගේම, තාත්තෙකුගෙ ආදරය අම්මෙකුට දෙන්නත් බැහැ. දරුවෙක් වෙනුවෙන් ලේ කිරට නොහැරුණාට, ඒ හා සමානම බැඳීමක්, ආදරයක්, දරු දුකක් හැම තාත්තා කෙනෙකුගෙම හිතෙත් තියෙනවා.

දරුවන් උස්සලා පොළවෙ ගහපු, එහෙම නැත්නම් පුංචි කාලෙ වඩාගෙන හුරතල් කරපු ඒ දරුවන්වම දූෂණය කරපු තාත්තලා අතළොස්සක් තරම් ප්‍රමාණයක් අපේ රටෙනුත් හොයා ගන්න පුළුවන් වුණාට, ඒ වචනයේ පරිසමාප්ථාර්තයෙන්ම නියම දරු සෙනෙහස හඳුනන සැබෑ තාත්තලා නෙවෙයි. බුදු බණේ සඳහන් විදියට දෙමව්පියො, දරුවො වෙලා ඉපදුණු වෛරක්කාරයො.

සමහර තාත්තලා දරුවන්ට තියෙන ආදරේ පෙන්නන්නෙ නැහැ. ඒ නිසාම එහෙම පවුල්වල දරුවො තාත්තලාට බය වෙනවා. ඉතින්, දරුවන්ට තාත්තලාගෙන් කරන්න තියෙන ඉල්ලීම් හැමෙකක්ම තාත්තලා ළඟට යන්නෙ අම්මලා හරහා. ආපහු දරුවන්ට තාත්තගෙ ප්‍රතිචාරය ලැබෙන්නෙත් අම්මලා හරහා. ඇත්තටම එහෙම පවුල් දිහා, එහෙම දරුවො දිහා පිටතින් ඉඳන් බලන් ඉන්න කොට ඒක හරිම ඛේදනීය තත්ත්වයක් විදිහට දැනෙනවා. මට හිතෙන විදිහට දරුවෙකුට තාත්තෙකුගෙ අගය ගැන, තාත්තෙකුට දිය යුතු ගෞරවය, සැලකීම ගැන කියාදීම සෑම අම්මෙකුගෙම යුතුකමක්, වගකීමක්.

අපේ රටේ ජීවත්වෙන අම්මලා ගැන හිතන්න. දරුවො ලැබෙන්න ඉන්න අම්මලා හුඟක් දෙනා සායන වලට යන්නෙ තමන්ගෙ අම්මලා එක්ක. උපදින්න ඉන්න දරුවන්ගෙ තාත්තලාට ඒ තැන්වලට යන්න තියෙන උවමනාවට හුඟක් වෙලාවට වැට බැඳෙන්නෙ තමන්ගෙ රාජකාරි කටයුතු වල වගකීම් ඊට වඩා ඉස්මතු වෙන හින්ද. ' මේ කුස දරන්

**මේනකා ජයතිලක**
ක්වීන්ස්ලන්තය

ඉන්න දරුවගෙ තාත්තා මමයි' කියලා මහා ආඩම්බරයකින් අම්මලාව ඉස්සර කරන් යන තාත්තලා ඕන තරම් ලංකාවෙ ඉන්නවා. ඒත් එහෙම අම්මලා දිහා බලලා ' අනේ මගෙ මහත්තයත් ආවා නං...' කියලා හිතන අම්මලා කොටස වැඩියි.

මෙය කියවන ඔබ අම්මෙක් නම් ජීවිතයත් මරණයත් අතර කෙරුණ සටනක් වගේ ඔබේ දරුවන් මෙලොව එළිය දුටු ඒ අසීරු අවස්ථාවෙදි දරුවන්ගෙ තාත්තා වශයෙන් ඔහු ගෙන් ඉටුවුණ යුතුකම් කොටස කොයිතරම්ද කියලා ඔබට දැනේවි. ඔබ සැබෑ දරු සෙනෙහසින් දරුවන් තුරුළු කරගන්න පියෙක් නම්.. ඒ අසිරිමත් මොහොත ඔබේ ජීවිතයට මහා වගකීම් සම්භාරයක් එකතු කළ හැටි, පියෙකු ලෙස උද්දම වුණු සැටි අදටත් දැනේවි.

දරුවෙක් උස් මහත් වුණා කියලාවත්, උසස් අධ්‍යාපනයට යොමු වුණා කියලවත්, දරුවන්ව දීගතල දුන්නා කියලාවත් තාත්තෙකුගෙ යුතුකම් කොටස ඉවරයි කියලා අත පිහදාගෙන පැත්තකට වෙන්න තාත්තලාට බැහැ. වයසට ගියත් තාත්තෙකුගෙ රැකවරණය, සෙනෙහස දරුවෙකුට ලොකු හයියක්. මේ රටේ සංස්කෘතියට අනුව දික්කසාදය බොහොම පහසු දෙයක් වුණත්, අම්මලා තාත්තලා වෙන්වුණත් තාත්තලත් අම්මලා හා සමානවම දරුවන්ගෙ කටයුතු ගැන හොයලා බලන නිසා තාත්තලා ගෙදර නැති අඩුව දරුවන්ට දැනෙන්නෙ හුගාක් අඩුවෙන්. මොකද තාත්තා ගෙදර නැති වුණත් දරුවො තාත්තගෙ ආදරය උපරිමයෙන්ම ලබන නිසා.

මේ ළඟදි අපේ යාළුවෙක්ගෙන්ම මට අපූරු කතාවක් අහන්න ලැබුණා. ඒ තව යාළුවෙක් ගැන. මොනයම්ම හෝ හේතුවක් නිසා බිරිඳගෙන් වෙන්වෙන්න තීරණය කළ ඔහු, දැන් උසාවියෙ ලොකු සටනක් ගෙනියන්නෙ තමන්ගෙ දරුවගෙ අයිතිය නීතියෙන් ලබාගන්න. වරක් තමන් ඉන්න රටට දරුවව හොරෙන් අරන් එන්නත් හැදුවලු. ආරංචියෙ හැටියට නම් අම්මා දරුවව තියාගෙන ඉන්නෙ, තාත්තට රිද්දන්නලු. මොකද තාත්තත් දරුවත් අතරෙ තියෙන බැඳීම, අම්මත් දරුවත් අතරෙ ඇති බැඳීමට වඩා හුඟක් සවිමත්ලු. නමුත් ඇත්ත නැත්ත මොකක් වුණත් ඒ තාත්තත් දරුවත් අතරෙ අපූරු බැඳීමක් තියෙනවා කියලා මට හිතෙනවා.

අම්මලා තාත්තලගෙ ප්‍රශ්ණ වලදි ඒ ප්‍රශ්ණ වලින් හෙම්බත් වෙන්නෙ අහිංසක දරුවො. විශේෂයෙන් මේ රටවල්වල හැදෙන අපේ දරුවන්ගෙ හිත් දෙමව්පියන්ගෙ පුංචි බහින් බස්වීම්වලදි පවා හුඟක් සසල වෙනවා. ඒක මං දැනගත්තෙ පිරිසක් ඉදිරියෙදි තමන් ඉන්නෙ කොතනකද කියලවත් නොහිතපු මව්පියො දෙන්නෙක්, බහින් බස් වෙද්දි ඔවුන්ගෙ දරුවා අපට තුරුළු වෙලා ඇහුවෙ ' අම්මියි තාත්තියි ඩිවෝස් වෙයිද?' කියලයි. එහෙම අහන්න හේතු වෙලා තියෙන්නෙ ඔවුන් මේ රටවල් වල පාසැල් මිතුරු මිතුරියො අතරෙදි අහන්නෙ දකින්නෙ බැඳීම් ගැන නෙවෙයි, ඒ වගේ වෙන්වීම් ගැන විතරයි.

දූවරු තාත්තලාට හුඟක් සමීපයි. ඒකෙන් අදහස් කරන්නෙ පුතාලා තාත්තලාට සමීප නෑ කියනෙක නෙවෙයි, පුතාලත් අම්මලත් අතරෙ හොඳ බැඳීමක් තියෙනවා. සමහර තාත්තලා ගේ ඇතුළෙ මොනතරම් ප්‍රශ්ණ, හිත් රිදවීම් තිබුණත්, ඒ ජීවිතෙන් පැනලා යන්න උත්සාහ කරන්නෙ නෑ. මොකද දරුවන්ට තියෙන බැඳීම වැඩි හින්ද. තාත්තලා ළඟ දරුවො තනිකරලා ගිහින් අම්මලා වෙනම ලෝකයක් ගොඩ නගා ගත්තත් , යාළු මිත්‍රයො, නෑදෑයො,තමන්ගෙ සමීපතමයො වෙනත් විකල්ප මාගී පෙන්නලා දෙද්දිත් ' දරුවො පුංචි වැඩියි, එයාලා දලා යන්න දුකයි' කියලා ඇස්වල කඳුළු පුරවා ගන්න තාත්තලා මේ සමාජයෙදිම අපට මුණ ගැහිලා තියෙනවා.

' අම්මත්තෙක්ක කොයි තරම් ප්‍රශ්ණ තිබුණත් තාත්තා කවදාකවත් අපිව දලා ගියේ නෑ' කියලා තාත්තලා ගැන මහා ආඩම්බරයකින් කතා කරන දූවරුත් අපි අතරෙ ඕන තරම් ඉන්නවා. තාත්තලා අම්මලා අතරෙ තියෙන ප්‍රශ්ණ විසඳගන්න බැරි තරම් උග්‍ර වෙලා ඒ නිසාම ඔවුන් නීතියෙන් වෙන්වුණත්, කිසිම දියණියක් කැමති වෙන්නෙ නැහැ තමන්ගෙ තාත්තා තවත් විවාහයකට යොමු වෙනවට. සමහරු ඒ තත්ත්වය දකින්නෙ, ඒක නිර්වචනය කරන්නෙ ඊර්ෂ්‍යාව යනුවෙන් වුණත්, ඇත්තටම ඒක ඊර්ෂ්‍යාව නෙවෙයි තාත්තලාගෙ ආදරය වැඩියෙන් බලාපොරොත්තු වෙන දූවරු ඒ ආදරය පවුලෙන් පිට කෙනෙකුට හිමිවෙනවට ඇති අකමැත්ත. අම්මගෙ තැනට තව කෙනෙක් පත් වෙනවට ඇති නොකැමැත්ත. දූවරුනුත්, තාත්තලත් අතරෙ ඇති බැඳීම තේරුම් ගන්න ඒ නිදසුනම හොඳටම ප්‍රමාණවත් නේද?

කලකට ඉහතදී ලංකාවේ ඉතාමත් ජනප්‍රිය වුණු ' යුවතිපති' සඟරාවේ සංස්කාරක මහේෂ් රත්සර මද්දුමආරච්චි විසින් ලියා ප්‍රකාශයට පත් කළ ' හැම තාත්තෙකුගෙම සිතිවිලි ' කෘතියේ සඳහන් වන පරිද්දෙන් හැම තාත්තෙකුගේම සිතිවිලි ලස්සන වෙනවා නම් විශේෂයෙන්ම සෑම දරුවෙකුටම මව් සෙනෙහස මෙන්ම පිය සෙනෙහසත් අත්‍යාවශ්‍ය බව සෑම අම්මෙකුටම තාත්තෙකුටම තේරුම් ගන්න පුළුවන් වෙනවා නම් දෙමව්පියන්ගෙ ප්‍රශ්ණ නිසාම තාත්තලගෙ ආදරය වෙනුවෙන් ලෝකෙටම හොරෙන් ඉකිගසන දරුවන්ගෙ ලෝකය ඇත්තටම ලස්සන වේවි නේද?

## සුභාෂිතයෙන්

පියකර සතර බඹ විහරන සිවි පෙදෙනි
වැර සැර නැන යුවල දල දිලි දන් සොඬිනි
පුවතර තුමුල තව වරනිඳුට නැඟෙමිනී
මනහර සෙත් පුරට පැමිණේවි සවි සතුනී

පියකර සකර බඹ විහරන සිවි පෙදෙනි වැර සැර නැන දල යුවල දන් සොඬිනි දිලි, පුවතර තුමුල තව වරනිඳුට නැඟෙමිනි සවි සතුනි මනහර සෙත් පුරට පැමිනෙවි

පියකර -(පියකරු) යහපත් වූ, සතර බඹ විහරන - සතර බ්‍රහ්ම විහරනය නැමති, සිවි පෙදෙනි - පාද සතරින් ද, වැර සැර නැන - (වීර සාර) වීරකම සහ ඥානය නැමති, දල යුවල - දල දෙක සහ දන් සොඬිනි දිලි - දානය නැමති සොඬවැලින් දිලුනා වූ, පුවතර - ප්‍රසිද්ද වූ, තුමුල - මහත් වූ, තව වරනිඳුට නැඟෙමිනි - තපස (තව්ස් දම) නැමති ඇත් රජු මත නැගී, සවි සතුනි - සියලු (මිනිසුනි) සත්ත්වයිනි, මහනර සෙත් පුරට එවි - සිත් සනහන ශාන්ති පුරයට හෙවත් නිවනට පැමිනෙවි.

සියලු සතුනි, යහපත් වූ සතර බඹ විහරණය නැමති සතර පය්න්ද, වීරකම සහ නුවන නැමැති දෙදලින් සහ දාන නැමති සොඬවැල ඇති ප්‍රසිද්ධ වූත් මහත් වූත් තපස නැමති ඇත් රජු පිට නැඟී නිවන් දකිවි.

වැරසැර යනු වීර සාර යන අදහස දෙනු පිනිස මෙහි යොදා ඇත. සැර වැර යන්න ද පද පෙරලියකින් වැරසැර විය හැකිය. වීර යන්න 'විරු' කියාත්, සාර යන්න 'සරු' කියාත් ය. සාමාන්‍ය වියහරේ ඇත්තේ, ස්තිර සාර සිංහලට බිඳෙන්නේ - තිරසරු- තිරසර - තරසර යන විදියටය්. ඒ අනුව වැරසැර යන්න 'විරුසර' විනි නම් මීට වඩා හැඩයි.

**- විකසිත -**

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සදහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243